# අනාගත කාලය - எதிர் காலம்

| සර්වනාමය | අනාගත කාලප්‍රත්‍යයන් | පුරුෂ ප්‍රත්‍යය |
|---|---|---|
| **நான்** | **ப்ப் / வ்** | **ஏன்** |
| **நாங்கள்** | **ப்ப் / வ்** | **ஓம்** |
| **நீ** | **ப்ப் / வ்** | **ஆய்** |
| **நீங்கள்** | **ப்ப் / வ்** | **ஈர்கள்** |
| **அவன்** | **ப்ப் / வ்** | **ஆன்** |
| **அவள்** | **ப்ப் / வ்** | **ஆள்** |
| **அவர்** | **ப்ப் / வ்** | **ஆர்** |
| **அவர்கள்** | **ப்ப் / வ்** | **ஆர்கள்** |
| **அது** | ක්‍රියාමූලයේ පිණිසාර්ථය | **உம்** |
| **அவை அவைகள்** | ක්‍රියාමූලයේ පිණිසාර්ථය | **உம்** |

අනාගත කාල වාක්‍යය ගොඩනැගීම සඳහා **ப்ப்/வ்** යනුවෙන් කාල ප්‍රත්‍යයන් දෙකක් ඇත. එම කාල ප්‍රත්‍යයන් දෙකෙන් කුමන ප්‍රත්‍යය යෙදේද යන්න තීරණය වන්නේ ක්‍රියාමූලයේ ස්වභාවය අනුව ය. එය පෙර ඉගෙනගත් පිණිසාර්ථ ක්‍රියා සාධනය ඇසුරින් අවබෝධ කරගැනීම ඉතා පහසු වේ. එනම් සෑම පිණිසාර්ථ ක්‍රියාවක්ම **அ** ශබ්දයෙන් හෝ **க்க** ශබ්දයෙන් අවසන් වේ.

කතෘ **அது** හෝ **அவை** (ඒවාට අයත් අනෙකුත් සර්වනාමයන් ) වනවිට පමණක් අනාගත කාල ක්‍රියා ප්‍රත්‍ය ලෙස **உம்** භාවිතා වේ.

| **පහත සඳහන් ක්‍රියාමූල සමග (வ் + පුරුෂ ප්‍රත්‍ය) එකතු වී ආඛ්‍යාතය හෙවත් ක්‍රියාව සම්පූර්ණ වේ.** | | | | | |
|---|---|---|---|---|---|
| 01 | ஓடு | දුවනු | 24 | காண் | දකිනු |
| 02 | போ | යනු | 25 | வாழ் | ජීවත්වෙනු |
| 03 | எழுது | ලියනු | 26 | மகிழ் | සතුටුවෙනු |
| 04 | அழு | අඬනු | 27 | ஆள் | පාලනය කරනු |
| 05 | விழு | වැටෙනු | 28 | சொள் | කියනු |
| 06 | சுடு | පුච්චනු/වෙඩි තබනු | 29 | கொல் | මරනු |
| 07 | கவலைப்படு | දුක්වෙනු | 30 | வெத்துக் கொல் | තබාගනු |
| 08 | தொடு | අල්ලනු | 31 | அணி | **අඳිනු** |
| 09 | பழகு | පුරුදුවෙනු | 32 | வரை | **අඳිනු** (චිත්‍ර) |
| 10 | விளையாடு | සෙල්ලම්කරනු | 33 | பாய் | පනිනු |
| 11 | தூங்கு | නිදාගනු | 34 | வா – මෙයට **வ்** එකතු වීමට පෙර **வரு** ලෙසට හරවාගත යුතුය. | එනු |
| 12 | மூடு | වසනු | | | |
| 13 | தாக்கு | පහර දෙනු | | | |
| 14 | நெருங்கு | වසනු | | | |
| 15 | வெட்டு | කපනු | 35 | தா – මෙයට **வ்** එකතු වීමට පෙර **தரு** ලෙසට හරවාගත යුතුය. | දෙනු |
| 16 | உதவு | උදව්කරනු | | | |
| 17 | விரும்பு | කැමති වෙනු | | | |
| 18 | வாங்கு | මිලදී ගනු | | | |
| 19 | | | 36 | | |
| 20 | போ | යනු | | | |
| 21 | அமர் | වාඩිවෙනු | | | |
| 22 | வளர் | හැදෙනු /වැඩෙනු | | | |
| 23 | செய் | කරනු | | | |

## அது / அவை

## හා

## අනාගත කාලය

- මෙහිදී ක්‍රියා මූලයේ පිණිසාර්ථ අවස්ථාවට உம் එකතු වී අවසන් ක්‍රියාව සෑදේ.

උදා - 01

ඌ යාවි (යන්නේය/යන්නීය)

**அது போ** ⟶ போக + உம் = போகும்

උන් යාවි (යන්නෝය)

**அவை போ** ⟶ போக + உம் = போகும்

↓

ඉහත වාක්‍ය දෙකෙහිම போக යනු போ යනක්‍රියා මූලයෙහි පිණිසාර්ථ අවස්ථාව වේ.

උදා - 02

- පූසා දුවාවි (දුවන්නේය)

பூ னை ஓடு ⟶ ஓட + உம் = ஓடும்

- පූසෝ දුවාවි (දුවන්නෝය)

பூ னைகள் ஓடு ⟶ ஓட + உம் = ஓடும்

ඉහත වාක්‍ය දෙකෙහිම ஓட යනු ஓடு යනක්‍රියා මූලයෙහි පිණිසාර්ථ අවස්ථාව වේ.

ආචාර්ය ගුණසේකර - ගාල්ල

- අනාගත කාලයට අදාලව උක්තයන් හා ආඛ්‍යාතයන් එනම් කතෘන් හා ක්‍රියාවන් එකතුවන ආකාරය උදාහරණ මගින් විමසා බලමු.

01. මම යාවි (යන්නෙමි) — நான் (போ வ் + ஏன்) போவேன்
02. අපි යාවි(යන්නෙමු) — நாங்கள் (போ வ் + ஓம் ) போவோம்
03. නුඹ යාවි(යන්නෙහි) — நீ (போ வ் + ஆய்) போவாய்
04. ඔබලා යාවි.(යන්නෙහු) — நீங்கள் (போ வ் + ஈர்கள்) போவீர்கள்
05. ඔහු යාවි.(යන්නේය) — அவன் (போ வ் + ஆன்) போவான்
06. ඇය යාවි .(යන්නීය) — அவள் (போ வ் + ஆள்) போவாள்
07. එතුමා/එතුමිය යාවි.(යන්නීය/යන්නේය) — அவர் (போ வ் + ஆர்) போவார்
08. එතුමන්ලා / එතුමියන්ලා / ඔවුහු යාවි.(යන්නෝය) — அவர்கள் (போ வ் + ஆர்கள்) போவார்கள்

09. ඌ යාවි.(යන්නේය/යන්නීය) அது (போ → போக + உம்) போகும்
10. උන් යාවි.(යන්නෝය) அவை (போ → போக + உம்) போகும்

පහත සඳහන් අනාගතකාල වාක්‍යයන් දෙමළට හරවා දෙමළ අකුරින් ලියන්න.

(මෙහිදී උක්තය ට ගැලපෙන පරිදි ආඛ්‍යාතය තැබීමේ පුහුණුව පමණක් අපේක්ෂා කෙරේ)

01.පූසා දුවාවි. (දුවන්නේය) ………………………………………

02. අම්මා යාවි. (යන්නේය) ………………………………………

03. මම ලියාවි. (ලියන්නෙමි) ………………………………………

04. ළදරුවා අඬාවි. (අඬන්නේය) ………………………………………

05. ගස වැටේවි. (වැටෙන්නේය) ………………………………………

06. තාත්තා පුච්චාවි. (පුච්චන්නේය) ………………………………………

07. එයාල වෙඩිතබාවි. (වෙඩිතබන්නෝය) ………………………………………

08. නිමාලි දුක්වේවි. (දුක්වෙන්නේය) ………………………………………

09. පූසන් මීයො අල්ලාවි. (අල්ලන්නෝය) ………………………………………

10. මල්ලී පුරුදුවේවි. ( පුරුදුවෙන්නේය) ………………………………………

11. නිමලුයි සමනුයි සෙල්ලම් කරාවි.(සෙල්ලම් කරන්නෝය )………………………………

12. බල්ලා නිදාගනීවි.(නිදාගන්නේය) ………………………………………

13. ලොකු හාමුදුරුවන් සැතපේවි.(සැතපෙන්නේය) ………………………………………

14. අම්මා කපාවි. (කපන්නේය) ………………………………………

15. ඔබලා උදව්කරාවි.(උදව්කරන්නෝය)………………………………………

16. අපි කැමති වේවි.(කැමතිවෙන්නෙමු) ………………………………………

17. තාත්තා මිළදී ගනීවි. (මිළදීගන්නේය)………………………………………

18. මම යාවි.(යන්නෙමි) ………………………………………

19. ගස වඩේවි.(වැටෙන්නේය) ………………………………………

20. එතුමන්ලා වැඩකරාවි.(වැඩකරන්නෝය) ………………………………………

21. මම දකීවි.(දකින්නෙමි) ………………………………………

22.අම්මායි අක්කායි ජීවත්වේවි.(ජීවත්වෙන්නෝය) ………………………………………

23. අපි සතුටුවේවි.(සතුටුවෙන්නෙමු) ………………………………...
24. රජතුමා පාලනය කරාවි.(පාලනය කරන්නේය) ………………………………...
25. ආච්චි කතන්දර කියාවි.(කියන්නේය) ………………………………...
26. එයාල තබාගනීවි.(තබාගන්නෝය) ………………………………...
27. ඇය ඇඳුම් අඳීවි.(අඳින්නේය) ………………………………...
28. අලියා චිත්‍ර අඳීවි.(අඳින්නේය) ………………………………...
29. වඳුරන් පනීවි.(පනින්නේය) ………………………………...
30. අපි ලියාවි.(ලියන්නේය) ………………………………...

ගුණසේකර - ගාල්ල

WhatsApp Group – 2022 /07/09

පිරිවෙන් අවසාන - 2022 කණ්ඩායම